DOI: 10.31357/fhssmst.2009.00015

# අද්‍යතන ගීතයේ පෝෂණයට සංගීත රචකයන්ගේ දායකත්වය

(තෝරාගත් සංගීතඥයන් පස් දෙනෙකු ඇසුරින්)

ඒ. එල්. ලාල් ආනන්ද

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ

ශාස්ත්‍රපති පරීක්ෂණය සඳහා

සිංහල විෂය යටතේ ඉදිරිපත් කරන නිබන්ධය යි.

උපදේශක තුමා මගින්
සිංහල හා ජන සංනිවේදන
අධ්‍යයන අංශ ප්‍රධාන මගින්
පීඨාධිපතිතුමා
පශ්චාද් උපාධි පීඨය.
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.
නුගේගොඩ

ඒ. එල්. ලාල් ආනන්ද
(GS/HU/704/98)

2009-12-23

මහාචාර්ය තිස්ස කාරියවසම් මහතා

(උපදේශක)

උපදේශකතුමනි,

## (සිංහල) ශාස්ත්‍රපති උපාධි නිබන්ධය ඉදිරිපත් කිරීම

"අද්‍යතන ගීතයේ පෝෂණයට සංගීත රචකයින්ගේ දායකත්වය"

ඉහත සඳහන් නිබන්ධය සම්බන්ධයෙන් 2009 - 09 - 24 වන දින පැවති වාචික පරීක්ෂණයේ දී පරීක්ෂක මණ්ඩලය පෙන්වා දුන් පරිදි නිබන්ධයේ තිබූ වියරණ ඌනතා සහ විෂයාත්මක අන්තර්ගතයේ තිබූ ඇතැම් අපැහැදිලි පෙළ ගැසීම් යළි පිරික්සා නිබන්ධය සංශෝධනය කළෙමි.

44 සහ 49 යන පිටුවල තිබූ සංවාද සහ භාවාතිශය ස්වරූපයට සමීප ව තිබූ බස් වහර වෙනස් කොට එය විෂයට සමීප වන සේ ලිවීමි.

උපකාරානුස්මෘතියේ තිබූ සදොස් වියරණ නිදොස් කළ අතර හැඳින්වීම යටතේ තිබූ ප්‍රකාශනවල නිරවද්‍යතාව තහවුරු වන සේ කරුණු පෙළ ගැස්වීමට කටයුතු කළෙමි.

පරීක්ෂණ වාර්තාවේ දක්වා තිබූ කෘතියේ සියලු දුබලතා පිළිබඳ දැඩි නිරීක්ෂණයකින් හා සැලකිල්ලකින් කටයුතු කොට කෘතිය නැවත සංශෝධනය කළ අතර, විශේෂයෙන් ම 86, 87 පිටුවල දැක්වෙන වික්ටර් දළුගම සංගීතවේදියාගේ සංගීත රීතිය සකස් වීමට බලපෑ කරුණු නැවත විෂයාත්මක ව ඉදිරිපත් කළෙමි.

ආචාර්ය පී. ඩී. එම්. වීරක්කොඩි මහතාගේ උපදේශකත්වය යටතේ සියලු න්‍යායික හා ප්‍රායෝගික මූලාශ්‍ර පුනර්නිරීක්ෂණය කොට, වික්ටර් දළුගම සහ නාදාත්මක සංජානනය පිළිබඳ පරිච්ඡේදය සංස්කරණය කළෙමි.

සමස්තයක් ලෙස පරීක්ෂණ වාර්තාවේ දක්වා තිබූ නිබන්ධයේ සියලු දුබලතා සහ සදොස් තැන් හඳුනා ගනිමින් ඒවා හැකිතාක් නිරවද්‍යතාවයෙන් යුතුව ඉදිරිපත් කිරීමට කටයුතු කළ බව මෙහිලා සඳහන් කරමි.

මෙයට
විශ්වාසී

ඒ. එල්. ලාල් ආනන්ද

පීඨාධිපති -
[illegible]
23/12/09.

PROF. TISSA KARIYAWASAM
B.A. (Hons), M.A. (Cey.), Ph.D (London)
Professor Emeritus
University of Sri Jayawerdenapura

B.A. (Hons), M.A. (Cey.), Ph.D (London)
Professor Emeritus
University of Sri Jayawerdenapura

මේ අපේක්ෂකයා විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත්, මේ නිබන්ධය ඇගැයීම් කාර්යය සඳහා විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීමට සුදුසු බවත් නිර්දේශ කරමි.

..........................................................

මහාචාර්ය තිස්ස කාරියවසම්

2009 - 12 - 23

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවි...
29 OCT 2008
පශ්චාද් උපාධි අධ්‍යයන ...

# පටුන


- උපකාරානුස්මෘති v
- හැඳින්වීම vii
- සාහිත්‍යයික සමීක්ෂා ix
- පර්යේෂණ ක්‍රමවේදය xii
- විෂය සීමාව xiii
- සාරාංශය xiv

1. පරිච්ඡේදය - අද්‍යතන ගීතයේ උපත හා ව්‍යාප්තිය 1
   - 1.1 අද්‍යතන ගීතය හැඳින්වීම 1
   - 1.2 නූර්ති ගීතය 3
   - 1.3 ටීටර් ගී 5
   - 1.4 ග්‍රැමපෝන් ගී යුගය 6
   - 1.5 ගුවන්විදුලි ගීතය 10
   - 1.6 චිත්‍රපට ගීතය 16
2. පරිච්ඡේදය - සිංහල ගීතයේ වික්ටර් දළුගම පිළිබිඹුව 23
   - 2.1 චරිතාලේඛය 23
   - 2.2 වික්ටර් දළුගම ගී නිර්මාණ 34
3. පරිච්ඡේදය - සිංහල ගීතයේ අභ්‍යුදය සඳහා දායක වූ සෙසු සංගීතවේදියෝ 56
   - 3.1 සිසිර සේනාරත්න 56
   - 3.2 සරත් බාලසූරිය 66
   - 3.3 ජයතිස්ස අලහකෝන් 72
   - 3.4 චන්‍ද්‍රදාස බෝගෝඩ 77
4. පරිච්ඡේදය - වික්ටර් දළුගම ප්‍රමුඛ සෙසු සංගීතවේදීන් පිළිබඳ සංගීත විද්‍යාත්මක විවරණයක් 84
   - 4.1 සංගීතමය මනස, සංවේදන ශක්‍යතා, ප්‍රත්‍යුත්පාදන පරිකල්පන ශක්තිය හා නවෝත්පාදනය 84
   - 4.2 අදාළ සංගීතවේදීන්ගේ නිර්මාණ සමාජ ආර්ථික දේශපාලන චලතාවයෙහි නිරූපණයක් ලෙස හඳුනා ගැනීම. 98
   - සමාලෝචනය 101
   - උපග්‍රන්ථය 102
   - සූචිය 112
   - ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 114

# උපකාරානුස්මෘති

අප රමණීයත්වයට පත්කළ මිනිසුන් පිළිබඳව කළ හැකි ලොකුම පින්කම වන්නේ ඔවුන්ගේ නිර්මාණ කාර්යයෙහි වූ ආධ්‍යාත්මික සුන්දරත්වය මතු පරපුරට පවරා දීම ය. එය කළ හැක්කේ බුද්ධිවාදී ගුණයෙන් ප්‍රතිමුක්ත ව ශාස්ත්‍රෝක්තියකින් එමග යන්නට පතන්නෙකුට පමණි.

එවන් පරපුරක අපේ කාලයේ අප දුටු විසල් ම මිනිසා වන්නේ මහැදුරු තිස්ස කාරියවසම් ගුරු පියාණන් ය. අප සෞන්දර්ය සරසවියේ සංගීතය උගන්නා සමයේ එතුමාණෝ එහි අධ්‍යක්ෂවරයා වූහ.

යහපත් ගිරවුන් ව පුරාකෘත භාරතීය සංගීත ආකෘතීන් පුනරුච්චාරණය කරමින් සිටි අපට දෑස් ලැබුණේ එතුමාගෙනි. භාවාතිශය නාටකයක් කොටගත් ශිල්පීය චර්යාවන්ගෙන් අත් මිදී වීමංසනය ආත්ම කොටගත් ශාස්ත්‍රීය චර්යාවට සෞන්දර්ය විශ්වවිද්‍යාලය යොමු කළේ එතුමන් ය. මුදියන්සේ දිසානායක වන් ශාස්ත්‍රවන්තයන් එහි සුරත් ඵලයන් ය.

අපගේ මෙ ගත ද, මෙ තැතද එවන් මගක පතනය වූ ආලෝක දහරින් විපුලිත වූවකි, විකසිත වූවකි.

එෆ්. එම්. ගුවන්විදුලි චර්යාවේ වෘත්තිකයෙකු ලෙස දශකයක පමණ කාලයක් නිමග්න ව හිඳිද්දී එහි වූ සුනරුත් සෙයියාවන් නිසා ම නව යමක් උගැන්මේ හා ගවේෂණය කිරීමේ අභිරුචිය දින දින අප සිත සුහුඹුල්ව වැඩිණි.

මේ පර්යේෂණ කාර්යය ඇරඹුමේ දී සංගීතවේදීන්ගේ නිවෙස්වලට යමින්, ඔවුනගේ තතු ඒකරාශී කොට ගැන්මට මට උපකාර වූයේ ස්වර්ණ ලියනගේ ය. ප්‍රථම ව ඔහු සෙනෙහසින් සිහිකරමි.

දෛවයෝගයේ අනාදරයන් නිසා විසන්ධි වූ හැදෑරීම් නැවත අරඹන්නට දිරි දැල්වූවෝ ගෞරවනීය පාතේගම ඤාණිස්සර හිමියෝ ය, මහාචාර්ය ඥානදාස පෙරේරා සූරිහු ය. පර්යේෂණ කාර්යයේ ප්‍රාරම්භක පියවරෙහි දී විෂයානුගත දිශානතිය සන්කරමින් සදුපදේශ සම්පාදනය කොට දුන්නෝ මහාචාර්ය සුනිල් ආරියරත්නයෝ ය.

මෙ සැමට නොනිමි දිරිබල වැඩෙවා'යි පතමි.

පර්යේෂණ කාර්යයෙහි ව්‍යාවෘතව සිටිය දී, සුනිල් අමරසිංහ, සන්ධ්‍යා බාලසූරිය, රංජිත් පීරිස්, සරත් දොඩම්ගොඩ, සෝමසිරි ප්‍රනාන්දු, ගාමිණී ධම්මික ඈ සහෘදයන් කළ ඇප උපකාර සිහිකිරීම සැපතකි.

යනෙන මගතොට අරුතින් ම සරු කොට ගන්නට යැයි කලණ සිත් පෙරදැරිව නිරන්තරව ම කීයේ අමරවංශ අතපත්තු සුධීන් ය. වරෙක වාරු නැතිව ගිය දිවියට ඔහු කළ උපකාර නිම් නැත.

දිවිය අසිරියකි. එය මිහිරි වූයේ සන්ධ්‍යා හා මපුතනු සකුණ නිසා ය. ඔවුන්ගේ වත පබසර හෙටක පැතුම් දල්වන කැඩපතකි.

සරසවි දිවියෙන් ඉසිඹු ලැබුවද, අතුල්‍ය මෙහෙවරක තත්පර ව සිටින්නා වූ මහැදුරු තිස්ස කාරියවසම් ගුරු පියාණන්ගේ සෙවණෙහි මුල් ම ශාස්ත්‍රීය පර්යේෂණ කාර්යය අරඹන්නට හැකි වීම සැබැවින්ම මා ලද ඉමහත් භාග්‍යයකි. එතුමන්ගේ හා පිහිට වූ සැමගේ දිවි තෙරුවන සරණින් සුහග වේවා'යි නිබඳව ම පතමි.

# හැඳින්වීම

කවර කලාවක් වුව ද අභිවර්ධනය වන්නේ ඒ හා බැඳුණු විචාර සම්ප්‍රදායක් සමග ය. ශ්‍රී ලාංකේය සංගීතය අරබයා එබඳු පුළුල් විචාර සම්ප්‍රදායක් ගොඩනැගී ඇති බවක් අපට දක්නට නොලැබේ. මෙනිසා මෙරට නිර්මාණාත්මක සංගීතයට දොර කවුළු විවර කළ බොහෝ සංගීතවේදීන්ට සිදුව ඇත්තේ අසාධාරණයකි. කලාකරුවන් පිළිබඳව කෙරෙන සුලභ පුද්ගල වර්ණනා, ජීවන තොරතුරු සම්පාදනය කිරීම් සහ ගුණකථනවලට ඔබ්බෙන් ඔවුනගේ නිර්මාණාත්මක අභිවහනය (Creative Peformance) විද්‍යාත්මකව ව්‍යවච්ඡේදනය කොට කෙරෙන විග්‍රහයක් ගැන මෙරට අසන්නට ලැබෙන්නේ ඉතාමත් කලාතුරකිනි.

ආනන්ද සමරකෝන්, සුනිල් සාන්ත, අමරදේව වැනි ප්‍රධාන පෙළේ සංගීතඥයන්ගෙන් පරිබාහිරව අප්‍රකට සංගීතඥයෝ පිරිසක් සිංහල ගීතයේ අභ්‍යුදයට දායක වූහ. එහෙත් ඔවුන් පිළිබඳව මේ දක්වා කිසිදු විධිමත් ශාස්ත්‍රීය ගවේෂණයක් සිදුවී නොමැත. මෙම ශාස්ත්‍රපති නිබන්ධයේ අපේක්ෂාව එවන් සංගීතවේදීන් පස් දෙනෙකු විසින් කරන ලද ගී නිර්මාණ සාහිත්‍යය හා සුසංයෝග වූ ස්වරූපයත්, ඔවුන්ගේ නිර්මාණ චර්යාව තුළ වූ වෛෂයික හා ආත්මීය ගුණාංග සංගීතවේදය සහ මානවවංශ සංගීතවේදයේ පර්යාවලෝක ඔස්සේ විමසා බැලීමත් ය.

වික්ටර් දළුගම, සිසිර සේනාරත්න, ජයතිස්ස අලහකෝන්, සරත් බාලසූරිය සහ චන්ද්‍රදාස බෝගොඩ යන නිර්මාණකරුවන්ගේ සංගීතකරණයන් (Musical Performance) උපලක්ෂමානිත කොට ගන්නට මෙරට විචාරයේ පුළුලැස දැල්වුණේ නැත. ඉන් පරිපීඩනයට හා සංතාපයට පත් මින් ඇතැම් සංගීතඥයෙක් අද ජීවතුන් අතර ද නැත. සෙස්සෝ අදිසිව කල් ගෙවති. සද්විචාරයක් නොවීම ඔවුන්ගේ උත්පාදක ශක්තියටත් අනුභූති ඥානයේ ස්වාධීනත්වයට හා ප්‍රවර්ධනයටත් කරන ලද බලවත් හානියක් විය. ඉන් ඔවුනගේ නිර්මාණ චෛතසිකයේ වූ නවාංග හා රම්‍යතා කෙමෙන් මන්දගාමී වූයේ ය.

ගීතය තුළ මෙරට වූ බොහෝ කතිකාවන් රචකානුභූතියම ඒක දේශයක් කොට ගත් සාහිත්‍යාත්මක කතිකාවන් ම විය. තනු නිර්මාණයේ දී සංගීතඥයන් පළ කළ සංගීතාත්මක බුද්ධිය (Musical Intelligence) කිසිදා ඔවුනට විෂය නොවූ කරුණක් විය. වික්ටර් දළුගම ඇතුළු යථෝක්ත සංගීතවේදීන් පිරිස ද එකී අභාග්‍යසම්පන්න ඉරණමට ගොදුරු වූ කලාකරුවෝ වූහ.

ගීතය යනු කාව්‍යයේ සංගීතය වන්නා සේ ම සංගීතය යනු නාදයේ කාව්‍යය වන්නේ ය. වික්ටර් දළුගම ඇතුළු අප විසින් කේන්ද්‍රීය කොට ගත් සංගීතවේදීන් පිරිස එකී නාදාත්මක කවීත්වයෙන් විභූෂිත ප්‍රතිභාවන්තයෝ ම වෙත්.

සාහිත්‍යයේ දී කාව්‍ය ශෝභාව ඇති කරවන ධර්මතාවලට අයත් වන ඕජස, ප්‍රසාදය, ශලේෂය, සමතාව, සමාධිය, මාධූර්යය, සුකුමාරතාව, උදාරතාව, අර්ථ ව්‍යක්තිය, කාන්තිය යන ගුණාංග භාවපූර්ණත්වයෙන් හෙබි ස්වර සංදර්භයක ද සංගීත රචනාවක ද නිරන්තරව අන්තර්ගතව තිබේ. එය හඳුනාගත යුතු වන්නේ සංගීතවේදය විසිනි.

මෙම පර්යේෂණයේ දී වික්ටර් දළුගම අප වෙසෙස් කොට ගත්තේ රසභාව නිරූපණයෙහි ලා ඔහු පළ කළ සුගමතාව නිසාම නොවේ. අපරදිග සංගීතයෙහි ඇසුර ඖචිත පූර්වකව ලාංකේය ජන රීතිය හා මුසුකොට ගත් නිසා ය. ඔහු ස්වකීය සංගීතයේ සියත් ලකුණු (Personal elements) මතු කොට ගන්නට පදනම කොට ගත්තේ හෙළ බස්වහරින් මතු කෙරෙන ගීතමය ගුණය හා රිද්ම නිරූපණයන් ය. එනිසා ඔහු භාෂාත්මක සංගීතයක් හා ඒකාත්මික වූ සංගීතවේදියෙකු සේ හැඳින්වීම යුක්ත සහගත ය. අපරදිග සංගීත විලාසයන් අතිශය අනුචිත විලාසයෙන් සිංහල ගීතයට ආරෝපණය කරගන්නා මෙවන් වකවානුවක අපරදිග ඇසුරේ වූ ධ්වනි රූපකයන් හෙළ බස් වහරේ වාග් රූපකයන් හා එක්කොට නව රූපකාර්ථවත් භාෂණයක් තනාගත් වික්ටර් දළුගම වැන්නෙකු හැදෑරීම සපුරා ම කාලීන අවශ්‍යතාවක් වන්නේ ය.

ගීතයක රසෝත්කර්ෂණයට හේතු වූ භාවාවලිය පෙළගැස්වීමේ දී සංගීතඥයාගේ කාර්යය අද්විතීය ය. මේ කාර්යය සඳහා විවිධ ස්වරූපයෙන් දායක වූ වික්ටර් දළුගම ඇතුළු සංගීතවේදීන් අතුරින් පස් දෙනෙකු තෝරා විග්‍රහයට ගැනුම වූ කලී සංගීත ඉතිහාසයේ නිහඬ පරිච්ඡේදයක් වඩාත් සංවිධිතව හා සූක්ෂ්ම ලෙස හඳුනා ගැනීමට උත්සාහ කිරීමකි. කිසිවෙකුගේ සාධාරණ විග්‍රහයකට හෝ නිසි සංගීතාත්මක විචාරයකට බඳුන් නොවුණ ද, ස්වකීය නිර්මාණ කාර්යයට වඩාත් යුක්තිසහගත වූ සංගීත නිර්මාණකරුවන් පස් දෙනෙකුගේ නිර්මාණ චර්යාව නිරවද්‍ය විෂය ප්‍රතිමානයන් ඔස්සේ විචාරය කිරීම හා හඳුන්වා දීම මෙම නිබන්ධයේ මූලික අරමුණ වේ.

අතීතය සංඥාර්ථවේදය (Semiology) ඔස්සේ හැදෑරීමට වත්මන් නිර්මාණකරුවන් යොමුකරවීම ද, සම්ප්‍රදාය හා අතීතය ඔස්සේ ශේෂව තිබෙන භාවමය සම්පත් උදීයමාන බලවේග ලෙස හඳුනා ගැනීමට අවශ්‍ය බුද්ධිමය උද්‍යෝගය දැල්වීම ද අනිර්වචනීය භාව චෛතසිකයන් මනෝ විද්‍යාත්මකව හා ධ්වනි විද්‍යාත්මකව විශ්ලේෂණය කොට ගැන්මට අවැසි ඉඩහසර සම්පාදනය කොට දීම ද, නිසි සංගීත විචාරයක් තැනීම සඳහා අවශ්‍ය විෂය ලෝකය එළි පෙහෙළි කොට දීම ද, සංගීතය යනු සමස්ත ආර්ථික, සාමාජික, සංස්කෘතික හා දේශපාලනික ලෝකයේ ජංගමත්වයේ පිළිබිඹුව බව අවධාරණය කිරීම ද මෙම පර්යේෂණයේ මුඛ්‍ය පරමාර්ථය වේ.

# සාහිත්‍යයික සමීක්ෂා

සංගීත විචාරය සම්බන්ධයෙන් මෙරට පළව ඇති පත පොත අල්ප ය. කලාශූරී විමල් අභයසුන්දර විසින් රචිත 'සංගීත සංහිතා' කෘතිය මේ අතුරින් මෙරට සංගීතයෙහි විචාරයෙහිලා නාදාත්මක අභිව්‍යක්තියෙහි ප්‍රාබල්‍යය හුවා දැක්වූ පූර්වගාමී වූ කෘතියක් සේ ගිණිය හැකි ය.

ශ්‍රී ලංකාවේ සංගීතය සම්බන්ධයෙන් ලියැවී ඇති පත පොත අතරින් වැඩි ප්‍රමාණයක් යම් යම් විෂය නිර්දේශයන් හා විභාග එල්ල කොට ගෙන ලියැවුණු පාඨ්‍ය ග්‍රන්ථ වේ. ඉන් සමහරක් තාරතාව, විපුලතාව, ධ්වනි ගුණය වැනි ධ්වනි විශේෂ ලක්ෂණ, ආවේණික ගුණාංග ආදී අරමුණට සීමාවන අයුරින් සංගීතයේ ඇතැම් අංග කෙටියෙන් හඳුන්වා දී ඇති ග්‍රන්ථයෝ ය. මේ අතර සෞන්දර්ය අධ්‍යයනයෙහි යම් යම් අංශ අළලා ලියැවුණු සමහර ග්‍රන්ථ හා ලිපි ලේඛන ආදියෙහි නාදයේ ලාක්ෂණික, සංගීතමය ශක්‍යතා, සංගීත රසාස්වාදනය වැනි කරුණු සම්බන්ධයෙන් කෙටි පැහැදිලි කිරීම් සඳහන් ව ඇති අයුරු දක්නට ලැබේ.[1]

1960 දශකයේ සිට 1980 දශකය දක්වාම සංගීතමය නාද භාවිතයෙහි වූ සූක්ෂමතා හා ව්‍යවහාරිකත්වය පිළිබඳ පුවත්පත් සාකච්ඡාවලට සහභාගීව ඩබ්. ඩී. අමරදේව, පී. වී. නන්දසිරි, ෂෙල්ටන් ප්‍රේමරත්න, ප්‍රේමසිරි කේමදාස ආදී සංගීතවේදීන් කළ ප්‍රකාශ සංගීත ශ්‍රාවකයන් තුළ යම් පිබිදීමක් ඇති කිරීමෙහි ලා උපස්තම්භක විය.

ශ්‍රී ලංකාවේ ජන සංගීතය මූලික කරගෙන මානවවංශ සංගීත විද්‍යාත්මක අගයයන්හි නිරත වූ වියතුන් අතර ඩබ්. බී. මකුලොළුව මහතා විසින් ඉටුකරන ලද කාර්යභාරය සුවිසල් ය. දේශීය නාදාමාලා සහ තාල පද්ධතීන් ජාතික සංගීත සම්ප්‍රදායක් දක්වා විකාශය කොට ගත හැකි ස්වරූපය ඔහුගේ 'හෙළ ගී මඟ' කෘතියෙන් දක්වා තිබේ. 'හෙළ ගී මඟ' ශ්‍රී ලාංකික සංගීත විද්වතෙකු විසින් රචිත මුල් ම පර්යේෂණ කෘතියක් ලෙස ද හඳුන්වා දීම අසාධාරණ නොවේ.

සංගීතඥ සී. ද එස්. කුලතිලක මහතා සමකාලීන මානවවංශ විද්‍යාත්මක ලෝක දෘෂ්ටියට අනුගත වන සේ පර්යේෂණයන්හි නියැලුණු විද්වතෙකි. ඔහුගේ පර්යේෂණ කෘති අතරින් 'ලංකාවේ සංගීත සම්භවය' යන කෘතිය පමණක් සලකා බැලුව ද මෙම කරුණ ස්ඵුට වේ.

1. අබේපාල, රෝලන්ඩ්, සෞන්දර්යය හා නාට්‍යකරණය පිළිබඳ මනෝ විද්‍යාත්මක කෘතියක්, සාර ප්‍රකාශන, 1972, 13 - 16 පිටු.

නෝර්වේ ත්‍රොන්ඩ්හෙම් විශ්වවිද්‍යාලයේ බලාකායි ලේඩෑන් යටතේ නවීන ධ්වනි විශ්ලේෂක භාවිතය පිළිබඳව පුහුණුවක් ලැබීමෙන් අනතුරුව සෞන්දර්‍ය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය රංජිත් ප්‍රනාන්දු මහතා සමග පර්යේෂණ අංශය මගින් ප්‍රකාශයට පත්කරන ලද 'මඟුල් බෙර' සහ 'Three Nelum Singers' නැමැති ලිපි දෙක ජන සංගීතය පිළිබඳ නව ප්‍රතිමානයක් දල්වන්නට කළ අගනා වෑයමකි.

රෝහණ බැද්දගේ මහතා විසින් සම්පාදිත 'සිංහල සංගීත ශෛලිය' (1989) නම් ග්‍රන්ථයෙහි ඇතුළත් වන්නේ සිංහල ජන සංගීතයේ ජන ව්‍යවහාරය (Folk Idiom) හෙවත් ජන සාරය (Folk Spirit) හඳුනා ගැනීම සඳහා දැරූ තැතක ප්‍රතිඵලයයි. එහි විවධ සිංහල ජන ගායනා ශෛලීන් සියුම් ව නිරීක්ෂණය කිරීමෙන් පසු හඳුනාගනු ලැබූ පොදු හා විශේෂ නාදමය යෙදුම් ක්‍රමවත් ආකාරයකට පෙළගස්වා තිබේ. මෙය ශ්‍රී ලංකාවේ ජන සංගීතය සම්බන්ධයෙන් සිදුකෙරුණු හරවත් මානව වංශ සංගීත විද්‍යාත්මක අධ්‍යයනයකි.

ඩී. සත්‍යජිත් විජේරත්න අන්ද්‍රාදි මහතාගේ 'සංගීත න්‍යායික සහ භෞතික විද්‍යාත්මක පාර්ශව' නම් ග්‍රන්ථය නාදයේ ලාක්ෂණිකවල සංගීතමය උපයෝගීතාවත් ඒවායේ පදනමත් සරල බසින් විග්‍රහ කොට ඇති පිටු 37 කින් කුඩා ග්‍රන්ථයකි. එසේ වුව ද, සංගීතයෙහි විද්‍යාත්මක පදනම පිළිබඳ අවබෝධයක් ලබනු රිසි විද්‍යාර්ථීන්ට ඉන් ලැබෙන ප්‍රයෝජනය අල්ප නොවන බව ද සඳහන් කළ යුතු ය.

පණ්ඩිත් අමරදේවයන් විසින් 1989 දී සංගෘහිත 'නාද සිත්තම්' කෘතිය සංගීතයේ නිර්මාණාත්මක ක්‍රියාදාමයන් හා භාව චෛතසිකයන් පිළිබඳ කළ රසාත්මක විග්‍රහයකි. සංස්කෘතීන් සම්ප්‍රේෂණය වීම සහ ජීවන අනුභූතීන් සංගීතවේදියෙකුගේ කාර්යය තුළ ආවේදනික ක්ෂේත්‍රයක් වන්නේ කෙසේදැයි ඉන් පැහැදිලි කෙරේ. භාවපූර්ණ බස්වහරකින් ප්‍රකාශයට පත්ව ඇති 'නාද සිත්තම්' ගේයතා - කවිතා දෙපසෙහි ම ලොල් වඩන සහෘදයින්ට රසාලිප්ත කෘතියෙකි.

ලූෂන් බුලත්සිංහලගේ සංස්කරණයෙන් පළ ව ඇති 'කේමදාස න්‍යාය සහ අරගලය' කෘතිය සංගීතඥ ප්‍රේමසිරි කේමදාසයන් සමග කළ සාකච්ඡාවක් ස්වරූපයෙන් දිගහැරේ. විශ්වීය මානයෙන් ප්‍රභාවිත නිර්මාණ කාර්යයේ දී සංගීතඥයාගේ බුද්ධිවාදී ආස්ථානය සැකසෙන්නේ කෙසේදැයි මෙහි මුඛ්‍ය මානය ව විස්තාරණය කෙරේ. සංගීතයට පෙර අපර දෙදිග වශයෙන් ඇති සංස්කෘතික හැඩරුව අභිභවනය කොට එය පොදු මානවීය සංවේදනා ලෙස උද්දීප්ත කිරීම සංගීතඥයාගේ කාර්යය බව කේමදාස මෙහි දී පවසයි. ඔහුගේ නිර්මාණ ජීවිතයේ ලද අත්දැකීම් හා පර්යේෂණාත්මක අවස්ථා මෙම කෘතියට ඇතුළත් ව තිබේ.

මහාචාර්ය සුනිල් ආරියරත්න මානව වංශ සංගීත විද්‍යාවේ විෂය ක්ෂේත්‍රයට නිසැක වශයෙන් අයත් වන පර්යේෂණ කෘති ගණනාවක කතුවරයා වෙයි.

| | |
|---|---|
| බයිලා කපිරිඤ්ඤා විමර්ශනයක් | (1985) |
| ග්‍රැමෆෝන් ගී යුගය | (1986) |
| කැරොල් පසම් කන්තාරු | (1988) |

ගාන්ධර්ව අපදාන පොත් පෙළ

1. මොහොමඩ් ගවුස් සහ බී. එස්. පෙරේරා
2. මුත්තුසාමි සහ රොක්සාමි
3. එඩ්වින් සමරදිවාකර සහ ආර්. ඒ. චන්ද්‍රසේන
4. සෝමදාස ඇල්විටිගල සහ පී. ඩන්ස්ටන් ද සිල්වා
5. පී. එල්. ඒ. සෝමපාල සහ මොහොමඩ් සාලි

යන කෘතීහු ද ඒ අතර විද්‍යාර්ථීන් සහ ගවේෂකයන් තුළ නව උත්තේජනයක් දැල් වූ පර්යේෂණාත්මක කෘතීහු වෙත්.

විද්වතුන්ගේ අවධානයට පාත්‍ර විය යුතු යැයි බොහෝ අය නොසිතූ ඇතැම් ශ්‍රී ලාංකේය සංගීත ගණ පිළිබඳව ඔහු විසින් කරන ලද පර්යේෂණවලින් පෙනී යන්නේ ඔහු මානව වංශ සංගීත විද්‍යාඥයෙකු සතුව පැවතිය යුතු මධ්‍යස්ථ භාවයෙන් පරිපූර්ණ තීක්ෂණ පර්යේෂකයකු බවයි.

සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පී. ඩී. ආර්. ප්‍රනාන්දු මහතා විසින් රචිත 'සංගීතවේදය මනෝවිද්‍යාත්මක ප්‍රවේශයක්' කෘතිය එතෙක් මෙතෙක් සංගීතවේදයේ විෂය මූලාශ්‍රයන් ඔස්සේ සිංහලෙන් පළවූ විශිෂ්ටතම කෘතිය ලෙසට හඳුන්වා දීමේ වරදක් නැත.

සංගීත පර්යේෂණයට බට විද්‍යාර්ථීන්ට ඊට අවැසි පාරිභාෂණවේදය සහ වෛෂයික විශ්ලේෂණයන් මෙම කෘතියට ඇතුළත්ව තිබීම සංගීත පර්යේෂණ ක්ෂේත්‍රයෙහි නියුක්තව සිටින පිරිස් වෙත මහත් උත්ප්‍රේරණයක් ව තිබේ.

මේ හැරුණු විට සංගීතඥ ජයන්ත අරවින්ද භාරතීය සංගීත සම්ප්‍රදාය සමගත් ආචාර්ය සුනිල් විජේසිරිවර්ධන විශ්ව සංගීත සම්ප්‍රදාය සමගත් කරන නව සංකථනයන් වරින් වර ජාතික පුවත්පත්වල පළවනු දක්නට ලැබේ. එය අර්ථසාර බව සඳහන් කළ යුතු ය.

මහාචාර්ය අමරා රණතුංග ගේ 'සෞන්දර්යාවබෝධය' කෘතිය පෙරදිග කලා විචාර සිද්ධාන්ත සමග කෙරෙන පුළුල් විග්‍රහයකි. ආසියාතික සංස්කෘතීන් සමග උත්තර භාරතීය රාගධාරී සංගීතයේ ඇති සමීප සබඳකමත්, ආසියාතික ජන විඥානයේ ඒකීය ධ්වනි චමත්කාරය හා ඇති අවියෝජනීය සබඳකමත් මින් ඉස්මතු කොට දැක්වේ.

පහත සඳහන් කෘතීහු ද විෂය මග සරු කිරීමේ අපේක්ෂාවෙන් එළිදැක්වූ සද් කෘතීහු වෙත්.

- සිංහල ගීතයට සංස්කෘත භාෂා සාහිත්‍යයේ බලපෑම. - එන්. ඒ. එස්. කේ. ප්‍රේමචන්ද්‍ර
- ජන සංගීත සිද්ධාන්ත - සී. ද එස්. කුලතිලක
- ජීවන අනුභූති - ආචාර්ය දයාරත්න රණතුංග
- ලාංකික සංගීතයේ රෝහණ ලකුණ - සමුද්‍ර වෙත්තසිංහ, රවී සිරිවර්ධන
- මාස්ටර් සංගීත යුග යාත්‍රිකයා - සමන්ත හේරත්
- වික්ටර් රත්නායක - නිර්මාණ විමර්ශන
- නූතන ගීතයේ සම්ප්‍රදායික ලක්ෂණ - සුනිල් ආර්. ගමගේ

# පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා දත්ත එක්රැස් කිරීම, ක්ෂේත්‍ර පර්යේෂණ හා පුස්තකාල පරිහරණය යන උභය මාර්ගයන්ගෙන් සිදු කළෙමු. එහි දී මතු දැක්වෙන ක්‍රියාකාරකම් ඇසුරෙහි අදාළ විෂය කරුණු ඒකරාශී කොට ගැනීම සිදුවිය.

1. මුද්‍රණද්වාරයෙන් පළ වූ පොත්පත් සඟරා, පුවත්පත්, ලේඛන පරිශීලනය කිරීම.
2. චිත්‍රපට, වීඩියෝ පට, ග්‍රැමපෝන් තැටි, සංයුක්ත තැටි හා හඬපට ආශ්‍රයෙන් තොරතුරු ලබා ගැනීම.
3. අදාළ නිර්මාණකරුවන්ගේ නිර්මාණ ඇතුළත් ගුවන්විදුලි, රූපවාහිනී, වැඩසටහන්වලට දායක වෙමින් සහභාගිත්ව නිරීක්ෂණය.
4. කලාකරුවන්, විද්වතුන් සහ දැනට ජීවත් ව සිටින අදාළ සංගීතවේදීන් සමග කළ සම්මුඛ සාකච්ඡා.

# විෂය සීමාව

මෙම පර්යේෂණය සඳහා අවශ්‍ය මූලික තොරතුරු සම්පාදනයේ දී විශේෂයෙන් අදාළ වකවානුව තුළ තිරගත වූ චිත්‍රපටත්, ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ තැටි පටි ගබඩාවත් පරිශීලනය කිරීමට සිදුවිය. අපගේ විෂය ප්‍රදේශයට අදාළ ඇතැම් චිත්‍රපට සංරක්ෂිතව නොතිබීම හේතුවෙන් ඒවායේ ගීතාංගයන් පිළිබඳ අධ්‍යයනය කිරීමට ලැබුණේ පසුව නිකුත් කරන ලද ගී තැටි ඔස්සේ පමණි.

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ තැටි පටි ගබඩාවෙන් ද අවශ්‍ය තොරතුරු සම්පාදනය කොට ගැනීමේ දී බලවත් දුෂ්කරතා මතු වූයේ ය. අප විසින් පර්යේෂණයට පාදක කොට ගනු ලබන සංගීතවේදීන්ගේ ඇතැම් ගී නිර්මාණ ගුවන්විදුලිය විසින් තාක්ෂණික ව සුරක්ෂණය කොට නොතිබූ අතර, ඉතිරි ව තිබූ බොහෝ තැටිවල තත්ත්වය ද ඉතා දුර්වල මට්ටමේ විය.

වේදිකා නාට්‍ය සඳහා සංගීතය නිර්මාණය කළ සංගීතවේදීන්ගේ ද කෘති සියල්ල ස්වර ප්‍රස්තාර සහිතව ලේඛනගත කොට නොතිබූ නිසා එකී තොරතුරු සපයාගත හැකි වූයේ ඔවුන්ගේ මතක සීමාවන්ට අනුගතව ය.

එකල ගුවන්විදුලියට පරිබාහිරව පටිගතකිරීම් කළ පෞද්ගලික ශබ්දාගාර සියල්ලම පාහේ මේ වන විට අභාවයට පත්ව තිබීමත් බොහෝ සමකාලීන ජ්‍යෙෂ්ඨ සංගීතවේදීන් හා ශිල්පීන් ද මේ වන විට ජීවතුන් අතර නොසිටීමත් පර්යේෂණයේ ජීව්‍යතාවට යම් බලපෑමක් කළ කරුණක් විය.

කෙසේ වෙතත් අදාළ සංගීතවේදීන්ගේ ගී නිර්මාණ ගැයූ කිසියම් ගායන ශිල්පී ශිල්පිනීන් පිරිසක් දැනට ජීවත් ව සිටින නිසාත්, 80 දශකයේ මැද භාගයේ සිට වාද්‍ය ශිල්පියෙකු ලෙසින් ව්‍යවහාරික සංගීතයේ නියැලී අප විසින් ලද අත්දැකීම් සහ නිරීක්ෂණයන් නිසාත් මෙම පර්යේෂණය යම් විෂයාත්මක පදනමකින් ගොඩනගා ගැනීමට බාධාවක් වූයේ නැත.

# අද්‍යතන ගීතයේ පෝෂණයට සංගීත රචකයන්ගේ දායකත්වය

(තෝරාගත් සංගීතඥයන් පස් දෙනෙකුගේ නිර්මාණ ඇසුරින්)

## සාරාංශය


**පළමුවෙනි පරිච්ඡේදය**

අද්‍යතන ගීතය නමින් අප විසින් හඳුනාගනු ලබන්නේ නූර්ති ගීය නිජ ස්වරය කොට උත්තර භාරතීය රාගධාරී සංගීතයේ ඛ්‍යාල, ගසල්, කවාලි යන ආකෘතීන්ට සමීපස්ථව නිර්මාණය වූ ගීත ය. (1877 - 1925) අතර කාලය නූර්ති නාටක ප්‍රවාහයේ ප්‍රභාශ්වර සංගීතාත්මක අවදිය ලෙස ද, ඉනික්බිතව ඒ අනුසාරයෙන් ඇරඹෙන ටීටර් ගී යුගය ලෙස ද එහි අවසන් අවධිය මෙහි දී සාකච්ඡා කෙරේ.

1905 - 1960 දක්වා කාලය තුළ වූ ග්‍රැමෆෝන් ගීයෙහි විකාශය ද, ඉන් මයික්‍රෆෝනය සමඟ බිහි වූ පාලිත හඬ සංස්කෘතිය පිළිබඳව ද මෙමගින් අවධානය යොමු කෙරේ.

(1924 - 1977) දක්වා ගුවන් විදුලි ගීතයේ වූ විවිධ ප්‍රවණතා මෙහි දි හඳුනා ගැනේ. දෘඪ සංස්කෘත රීතියෙන් ද, උත්තර භාරතීය සංගීතයේ ශාස්ත්‍රීය ආකෘතික ලක්ෂණවලින් ද ඈඩිව හික්මවනු ලැබූ ග්‍රැමෆෝන් තැටි යුගයෙන් මිදී නව ශිථිල ගී ව්‍යාපාරයක ආරම්භය ගුවන්විදුලිය විසින් සත් කරනු ලැබී ය.

1947 සිට 1980 දශකය දක්වා බිහි වූ සිංහල චිත්‍රපට ගීතය සමස්තයක් වශයෙන් ගත් කල ග්‍රාම්‍යත්වය ද, ඕලාරිකත්වය ද භජනය කරමින් අනුකරණවාදී මගක ගමන් ගත් බව පෙනේ. ඉන් මිදුණු සිනමාරූපී හා භාවානුරූපී ගී විටින් විට චිත්‍රපටවලට ඇතුළත් වුවත් එය සිනමා ගීතයේ පොදු ඓක්‍යය වූයේ නැත. කෙසේ වෙතත්, සිංහල සිනමා ගීතය භාව සම්ප්‍රයුක්ත දෘශ්‍ය කාව්‍යානුගත නිර්මාණයක් බවට පත්කිරීමේ පූර්වගාමී සංගීතවේදීන් වූ ඩබ්. ඩී. අමරදේව, ප්‍රේමසිරි කේමදාස, සෝමදාස ඇල්විටිගල, ලයනල් අල්ගම ආදීහු මෙහි දී කැපී පෙනෙති.

අවසන් වශයෙන් නූර්ති ගීතයේ සිට ග්‍රැමෆෝන් යුගය, ගුවන්විදුලි ගීතය, චිත්‍රපට ගීතය යන ගීතයේ විවිධ ස්වරූපයන් සලකා බලන කල රාගධාරී සංගීතයෙන් උරුම කොට ගත් ස්ථායි - අන්තරා ආකෘතිය ම යළි යළි ප්‍රකාශනයට පත් වීමක් හා නූර්ති ගීතයේ පුනරූපණයක් ලෙසින් ම සිංහල ගීතය හඳුනා ගත හැකි වන්නේ ය.

## දෙවැනි පරිච්ඡේදය

(සිංහල ගීතයේ වික්ටර් දළුගම පිළිබිඹුව - චරිතාලේඛය)

පර්යේෂණ කාර්යයෙහි මුඛ්‍ය නිමිත්ත බවට පත්කොට ගන්නා සංගීතඥ වික්ටර් දළුගමගේ චරිතාලේඛය තුළින් මුලින් ම හඳුනා ගැනීමට උත්සුක වන්නේ ඔහුගේ ජීවන ආඛ්‍යාන රීතියෙහි වූ චලතාවන් ය. අවසන් පරිච්ඡේදයේ දී සංගීතවේදය ඔස්සේ කෙරෙන විශ්ලේෂණ සඳහා පදනම් මහල ලෙස ඔහුගේ ජීවන අනුභූතීන් විමසා බැලීම මීට අන්තර්ගත කොට තිබේ.

## වික්ටර් දළුගම ගී නිර්මාණ

තිරගත වූ සිංහල චිත්‍රපට 7 කත්, ගුවන්විදුලි හා තැටි ගීත 600 කට ආසන්න සංඛ්‍යාවකත් සංගීත අධ්‍යක්ෂණය කළ වික්ටර් දළුගම පෙර අපර දෙදිග සංගීත සම්ප්‍රදායයන් හදාළ සංගීතවේදියෙකි. එසේ වුව ද ඔහුගේ නිර්මාණාත්මක අභිවහනයෙහි (Creative Performance) සහ සංගීතකරණයෙහි (Musical Performance) වැඩි වශයෙන් දක්නට ලැබෙන්නේ අපරදිග සංගීත ශෛලියකින් ප්‍රභාවිත රීතියකි. බහුතරයක් කතෝලික ජනයා විසූ මොරටුව මෝල්පේ උපන් වික්ටර් දළුගමට කවර සංගීත සම්ප්‍රදායක් හැදෑරුවත්, පරිසරයෙහි වූ අපරදිග ආරෙන් මිදීමට නොහැකි විය. ඔහු එය ම වඩාත් ලාංකේය ජන රීතිය හා බද්ධ වන ප්‍රකාශන ලීලයක් තනා ගැනීම පිණිස භාවිත කොට ගත්තේ ය. ඔහු හෙළ බසෙහි වූ රිද්ම රූපණය හා සංගීතාත්මක බව කෙරෙහි උද්‍යෝගිමත් වූ සංගීතඥයෙකි.

## තෙවැනි පරිච්ඡේදය

**සිංහල ගීතයෙහි අභ්‍යුදය සඳහා දායක වූ සෙසු සංගීතවේදියෝ**

සිසිර සේනාරත්න, සරත් බාලසූරිය, ජයතිස්ස අලහකෝන් සහ චන්ද්‍රදාස බෝගොඩ යන සංගීතවේදීහු ලාංකේය ගීතයේ ප්‍රාසාංගිකත්වය දේශජ ව සුරූපණය කිරීමෙහි ප්‍රෝත්සාහී වූ සංගීතවේදීන් සිව් දෙනෙකි.

සිසිර සේනාරත්න සහ සරත් බාලසූරිය ගුවන් විදුලි ගි නිර්මාණයට අමතරව චිත්‍රපට සංගීතයේ ද ස්වකීය ප්‍රතිභානය පළ කළ සංගීතවේදීන් දෙපොළකි. ජයතිස්ස අලහකෝන් වඩාත් ඉස්මතු වන්නේ නාට්‍ය සංගීත අධ්‍යක්ෂවරයෙකු වශයෙන් හා ගුවන් විදුලි තනු සම්පාදකයෙකු ලෙසිනි. චන්ද්‍රදාස බෝගොඩ 70 දශකයේ ගුවන් විදුලි ගීතය අරබයා රාගධාරී සංගීතයේ චමත්කාරය උචිත ලාංකේය රීතියකින් අත්දකින්නට වෑයම් කළ සංගීතඥයෙකි. මොව්හු සිව් දෙනා ම එකල මෙරට ජාතික සංස්කෘතික පුනරුදයන් හරහා ස්වායත්ත ජාතික සංගීත සම්ප්‍රදායක් තැනීම පිළිබඳ දායකත්වය පළ කළ සංගීතවේදීහු වෙත්.

## හතරවැනි පරිච්ඡේදය

**වික්ටර් දළුගම ප්‍රමුඛ සෙසු සංගීතවේදීන් පිළිබඳ සංගීත විද්‍යාත්මක විවරණයක්.**

4.1 වික්ටර් දළුගම ප්‍රමුඛ සෙසු සංගීතවේදීන් සිව්දෙනාම පාරිසරික සාධක සහ ශ්‍රවණ සංවේදන ශක්‍යතා ඔස්සේ සංජානනය වීම් නිර්මාණාත්මක කාර්යයන් දක්වා වැඩුණු ස්වරූපය මෙහි දී සංගීත විද්‍යාත්මකව විශ්ලේෂණය කෙරේ. ඊට කාල් ඊ. සීසෝ සංගීතමය මනස පිළිබඳ ඉදිරිපත් කොට ඇති නිර්ණායකයන් පාදක කොට ගැනේ.

4.2 අදාළ සංගීතවේදීන්ගේ නිර්මාණ සමාජ ආර්ථික චලතාවයෙහි නිරූපණයක් ලෙස හඳුනා ගැනෙන්නේ මානව වංශ සංගීතවේදයේ පර්යාවලෝක කිහිපයක් භාවිත කොට ගනිමිනි.

1. රටක පවතින්නේ තුලනාත්මක ආකල්පයක පිහිටා පිරික්සිය යුතු සංගීත ගණ සමූහයකි.
2. සංස්කෘතියෙහි අනෙකුත් පාර්ශ්ව සමග සමීප සබඳතා ඇති කලාවකි.
3. අවිච්ඡින්නතාවයෙන් යුතු වන නමුත් නිරන්තර වෙනස්වීම්වලට ද භාජනය වන්නකි.
4. සංස්කෘතීන් වෙන් කර දක්වන්නා වූත් සංස්කෘතික සබඳතාවලට හේතු කාරක වන්නා වූත් සංසිද්ධියකි.

## සමාලෝචනය

අතීතය සංඥාර්ථවේදය ඔස්සේ හඳුනාගත යුතු ය. එවිට නිර්මාණාත්මක සංවර්ධනය උදෙසා අවැසි සක්‍රීය භාවමය සම්පත් හඳුනා ගැනීමට ඉඩ ලැබේ. එය සම්ප්‍රදායේ සාරය නව්‍යත්වය මත ස්ථාපනය කිරීමට නිරන්තර ව මං හසර පාදන්නේ ය.

ඒ අනුව වික්ටර් දළුගම, සිසිර සේනාරත්න, සරත් බාලසූරිය, ජයතිස්ස අලහකෝන් සහ චන්‍ද්‍රදාස බෝගොඩ එවන් සංඥාර්ථයෝ වෙත්.